ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் திணைக்களம்
LAND COMMISSIONER'S DEPARTMENT

අංක 7, ග්‍රෙගරි මාවත, කොළඹ 7
இல. 7, கிறகறிஸ் ஒழுங்கை, கொழும்பு 7
No. 7, GREGORY'S AVENUE, COLOMBO 7

මගේ අංකය / எனது இல. / My No. } 4/10/චක්‍රලේඛ 2002/04.

ඔබේ අංකය / உமது இல. / Your No. }

ෆැක්ස් / தொலைநகல் / Fax } 684051

2002.05.30

සියළුම ප්‍රාදේශීය ලේකම් වරුන්.

**අනවසර මැණික් ගැරීම් සිදුවන රජයේ හා වතු ඉඩම් මැණික් ගැරීම සඳහා නිදහස් කරවා ගැනීම.**

උක්ත මැයෙන් නිකුත් කරන ලද මගේ අංක 4/10/චක්‍රලේඛ 99/06 හා 1999.08.30 දිනැති චක්‍රලේඛයට අමතර වශයෙනි.

රජයේ ඉඩම් මැණික් ගැරීමේ කටයුතු සඳහා නිදහස් කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාමර්ග සම්බන්ධයෙන් 2001.11.08 දින කම්කරු, යොවන කටයුතු හා ඛණිජ සම්පත් අමාත්‍යාංශයේදී ඉඩම් අමාත්‍යාංශය හා ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව සහභාගී වී පැවැත්වූ සාකච්ඡාවේදී ගත් තීරණ අනුව පහත සඳහන් පරිදි ක්‍රියා කළ යුතුයි.

මැණික් ගැරීම සඳහා රජයේ ඉඩම් ලබාදීම ප්‍රතිපත්තියක් වශයෙන් මගේ ඉහත චක්‍රලේඛයේ සඳහන් කමිටුවේ නිර්දේශ මත සිදුකළ යුතුය. එම කමිටුවේ රැස්වීම් පැවැත්වීම අවශ්‍ය ම නොවේ නම් ඉඩමේ පිහිටීම අනුව වැදගත් වන වාරිමාර්ග දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය, ඉඩම් පරිහරණ හා සැලසුම් අංශය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ආදී ආයතන වලින් නිර්දේශිත වාර්තා ලබාගෙන ප්‍රාදේශීය ලේකම්, පළාත් ඉඩම් කොමසාරිස්ගේ නිර්දේශය මත ඉඩම් නිදහස් කිරීම ද කළ හැකිය.

- කමිටුවේ සභාපති වශයෙන් ඉඩම් කොමසාරිස් හෝ ඔහුගේ නියෝජිතයෙකු කටයුතු කරනු ඇත.

- කමිටුවේ කාර්යාලය වශයෙන් ඉඩම් කොමසාරිස් කාර්යාලය ප්‍රයෝජනයට ගත යුතුය.

- කමිටු රැස්වීම් ඉඩම් කොමසාරිස් විසින් තීරණය කරනු ලබන පරිදි කාර්යාලයේදී හෝ ක්ෂේත්‍රයේදී පැවැත්විය හැක.

දුරකථන අංක / தொலைபேசி இல. / Telephone Nos. } 695824, 695833, 695834, 695835, 695837, 695844, 694025

CS CamScanner

- වෙනත් ඕනෑම ආයතනයක නියෝජිතයක් අවශ්‍ය යැයි ඉඩම් කොමසාරිස් අදහස් කරන විට ඒ ආයතනය කැඳවීමට ඉඩම් කොමසාරිස්ට කටයුතු කළ හැක.

- මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය මැණික් ගැරීම සඳහා රජයේ ඉඩම් යොදා ගැනීමට අපේක්ෂා කරන අවස්ථා වලදී එම ඉඩම් නිදහස් කර ගැනීමේ කාර්යය සඳහා කරනු ලබන ඉල්ලීම පළාත් ඉඩම් කොමසාරිස්/ නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්ට හා ප්‍රාදේශීය ලේකම්ට පිටපත් සහිතව කෙලින්ම ඉඩම් කොමසාරිස් වෙත එවිය යුතුය.

- එසේ ඉදිරිපත් කරනු ලබන සෑම අයදුම්පත්‍රයක් සම්බන්ධයෙන්ම මැණික් ගැරීමේ කටයුතු සඳහා පාවිච්චි කිරීමට බලාපොරොත්තු වන රජයේ ඉඩමේ පැහැදිලිව සම්පූර්ණ විස්තරයක් සහ සිතියමක් ද සහිතව ඉඩම් කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය.

- කමිටුවේ කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය සියළු අවශ්‍යතාවයන් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් ඉඩම් කොමසාරිස් වෙත ලබාදිය යුතුය.

මින් ඉදිරියට මෙම චක්‍රලේඛයේ උපදෙස් පරිදි කටයුතු කළ යුතු බව සටහන් කර ගන්න. මෙම චක්‍රලේඛය ඉඩම් අමාත්‍යාංශයේ එකඟතාවය ඇතිව නිකුත් කරන ලදී.

එස්.ජේ.පතිරණ,
ඉඩම් කොමසාරිස්.

පිටපත්:-

1 සියළුම දිසාපතිවරුන් - දැන ගැනීම සඳහා
2 සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන් - දැනගැනීම සඳහා
3 සියළුම නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්වරුන් - දැනගැනීම සඳහා
4 සභාපති, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය - දැ.ගැ. සඳහා

ඉ/22

CamScanner